පාර්ලිමේන්තුවේ ප්‍රකාශන ... -5- ... කො. ම.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 15 දරන
# මෝටර් රථ (පැවරීමේ බද්ද)
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 මාර්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 මාර්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 20 යි තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 15 දරන මෝටර් රථ (පැවරීමේ බද්ද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 මාර්තු මස 19 වන දින]

එල්.ඩී.—ඕ. 84/79.

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 13 දරන මෝටර් රථ (පැවරීමේ බද්ද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 15 දරන මෝටර් රථ (පැවරීමේ බද්ද) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 13 දරන පනතෙහි 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 13 දරන මෝටර් රථ (පැවරීමේ බද්ද) පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මේ පනත අදාළ වන මෝටර් රථයක පැවරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන අදාළ බද්ද.

4. මේ පනත අදාළ වන මෝටර් රථයක පැවරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන අදාළ බද්ද රුපියල් දෙදහස් පන්සියයක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "මෝටර් රථය" යන යෙදුමෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

'"මෝටර් රථය" යන්නෙන්, මෝටර් සයිකලයක්, මෝටර් ගිලන් රථයක්, මෝටර් අවමංගල්‍ය රථයක්, ආබාධිතයන් සඳහා වූ රථයක් හෝ මගීන් ගෙන යන රෝද තුනේ වාහනයක් නොවන්නා වූ ද, (රියැදුරා ඇතුළු ව) තැනැත්තන් අට දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් සහ ඔවුන්ගේ බඩුබාහිරාදිය ගෙනයාම සඳහා නිර්මාණය කරන ලද්දා වූ හෝ අනුවර්තනය කරන ලද්දා වූ ද මෝටර් වාහනයක් අදහස් වන අතර එසේ නිර්මාණය කරන ලද හෝ අනුවර්තනය කරන ලද ට්‍රේලරයක් ඊට ඇතුළත් වේ.;'; තවද

(2) "මේ පනත අදාළ වන මෝටර් රථය" යන අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

'"මෝටර් සයිකලය", "මෝටර් ගිලන් රථය", "මෝටර් අවමංගල්‍ය රථය" සහ "ආබාධිතයන් සඳහා වූ රථය" යන යෙදුම්වලට, මෝටර් වාහන පනතේ ඒවාට පිළිවෙළින් දී තිබෙන්නා වූ අර්ථයන් ම ඇත්තේ ය;'.

සංශෝධනය අතීතයට බලපාන බව.

4. මේ පනතේ 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා, 1979 නොවැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

ජේ 48141—11,500 (80/02)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (විදේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.